**ශීර්ෂය 301- සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 301 සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂය 03 ක් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයද වැය විෂය 07 ක් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට 92 ක් දක්වා වූ පරාසයකද ඉතිරිවීම් පැවතුණෙන් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් තාත්ත්විකව සහ නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ජාතික අයවැය චක්‍රලේඛ 1/2023 අනුව වියදම් සීමා කිරීම ද ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී ඇති බව හා 2025 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට සහ 2024 වර්ෂයේදී ද වෙන් කරන ලද ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා ඉදිරිපත් කල හේතු පිළිගත නොහැකි අවස්ථා 6 ක් නිරීක්ෂණය වූ අතර සමූපකාර සංවර්ධන අරමුදලින් වියදම් දැරීම නිසා විදේශ ගමන් වියදම් වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි වීම සහ අනෙකුත් වැය විෂයන් වල පසුගිය වර්ෂයට සාපේක්ෂව විශාල ලෙස ප්‍රතිපාදන වැඩිකරගෙන තිබීම මෙලෙස ඉතිරි වීමට හේතු වී ඇති බැව් නිරීක්ෂණය විය. | ජාතික අයවැය චක්‍රලේඛ 1/2023 අනුව වියදම් සීමා කිරීම ද ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී ඇති බව හා ඉදිරි වර්ෂවලදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ වැය විෂයන් 02 කට අදාලව බැරකම් රු.171,608 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැය විෂයක් සඳහා වූ ප්‍රතිපාදන ඉතිරිය රු.1,534,479 ක් වූ අතර බැරකම් රු.1,642,997 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම රු.108,518 ක් වී තිබුණි. | වැය විෂය 1403 යටතේ අයකරනු ලබන රේටයන් ඉහළයාම හේතුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ප්‍රතිපාදන ඉක්මවා ඇති බව. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹිය යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක ආහාර වැඩසටහන දෙවන අදියර යටතේ සහල් මෙට්‍රික් ටොන් 1249.5 ක් පාසැල් 7917 ක් වෙත බෙදාහැරීමේ කටයුතු සිදු කිරීමේදී ආහාර දෙපාර්තමේන්තු ගබඩාවල සිට පලාත් 09 හි විවිධ සේවා සමූපකාර සමිති වෙත බෙදා හැරීමට ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමය තෝරා ගෙන තිබුණු අතර පාසැල් සඳහා බෙදා හැරීම විවිධ සේවා සමුපකාර සමිති මගින් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | පළාත් 09 හි පාසැල් වෙනුවෙන් සහල් කිලෝග්‍රෑම් 1,247,475 ක් බෙදාහැරීම සඳහා රු.18,712,125 ක් ගෙවා තිබුණ ද, අලෙවි සංගමය විසින් විවිධ සේවා සමූපකාර සමිති වෙත බෙදාහරින ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 1,233,225 ක් පමණක් වී තිබුණි. | පාසල් වෙත බෙදාහැරීම සඳහා අළෙවි සංගමය මගින් ආහාර කොමසාරිස් ගබඩා වලින් සහල් කි.ග්‍රෑම් 1,249,450ක් භාරගෙන ඇති බව.<br>පළාත් තුළ බෙදාහැරීමට විවිධ සේවා සමුපකාර සමිති වෙත 1,233,255 kg ක් ලබා දුන් බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ii) | ඉහත බෙදා හැරීමේ වියදමට අමතරව පලාත් 08 ක් වෙනුවෙන් පරිපාලන වියදම් ලෙස රු.800,000 ක් හා මධ්‍යම පලාත් දිස්ත්‍රික් තුනෙහි ප්‍රධාන සමිති 3 කට ලබාදුන් සහල් එම සමිති විසින් අනෙකුත් සමිති වලට භාරදීමේ වියදම් ලෙස රු.596,166 ක් ද වශයෙන් පලාත් විවිධ සේවා සමුපකාර සමිති සමාගම්වලට රු.1,396,166 ක අතිරේක වියදමක් ගෙවා තිබුණි. | පළාත් මගින් යොමු කරන ලද ලිපි අනුව පරිපාලන වැය ලබාදුන් අතර මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද ගබඩා පහසුකම් පවතින සමිති 03ක් විසින් පාසල් වෙත සහල් බෙදාහැරීම සඳහා වෙනත් සමුපකාර සමිති වෙත භාරදීම සිදුකර ඇති බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

**(ආ)** මහජන චීන සමූහාණ්ඩුව මගින් රජය වෙත ප්‍රදානය කිරීම සඳහා කොළඹ වරාය වෙත ගොඩබානු ලබන මෙට්‍රික් ටොන් 5000 ක දෙවන සහල් තොගය වරායෙන් නිෂ්කාශනය කිරීම සහ පාසැල් වෙත බෙදාහැරීමේ කාර්ය සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරමින් අධ්‍යාපන අමාත්‍යාංශය 2022 දෙසැම්බර් 20 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මෙහිදී ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයකට නිශ්කාශන කටයුතු පවරා සහල් මෙට්‍රික් ටොන් 3000 ක ප්‍රමාණයක් නිශ්කාශනය සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි මෙට්‍රික් ටොන් 2000 ක ප්‍රමාණය නිශ්කාශනය කිරීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පල කර ඒ අනුව ශ්‍රී ලංකා නැව් සංස්ථාව තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | පෞද්ගලික ආයතනය විසින් නිශ්කාශන කටයුතු සිදු කරන ලද සහල් මෙට්‍රික් ටොන් 3000 ක් වෙනුවෙන් එම ආයතනයට රු.10,309,522 ක මුදලක් ගෙවා තිබුණද, ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් රු.9,038,960 ක් වූයෙන් රු.1,270,562ක් වැඩිපුර ගෙවා තිබුණි. | කම්කරු කුලිය හා කන්ටේනර් ප්‍රවාහනය කිරීමේ කුලිය පමණක් ප්‍රදානපත්‍රයේ සඳහන් වන අතර නියෝජිත ගාස්තු, රේගු ලියකියවිලි ගාස්තු වැනි අනෙකුත් ගාස්තු සඳහා මිල ගණන් ඉදිරිපත්කර ප්‍රදානය ලබා දී නොමැති බැවින් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු බව හා ඒ අනුව ගෙවීම් නිවැරදි බව | ඉදිරිපත් කරන ලද මිල ගණන්වලට අනුව කටයුතු කල යුතුය. |
| (ii) | සහල් මෙට්‍රික් ටොන් 2000 ක නිෂ්කාශන කටයුතු සිදු කිරීම වෙනුවෙන් ලංකා නැව් සංස්ථාවට රු.7,501,666 ක මුදලක් ගෙවා තිබුණද, සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද මිල රු.6,051,300 ක් වූයෙන් එම මුදල ඉක්මවා | රු. 5,262,000ක මුදලකට ටෙන්ඩරය පිරිනමා ඇති අතර එම මුදල පමණක් ගෙවීම් කර ඇති බව. අනිකුත් ගෙවීම් යනු දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් වන අතර එම මුදල සී/ස ලංකා නැව් සංස්ථාව විසින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ගෙවීම් කර අපගෙන් ප්‍රතිපූරණය | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.1,450,366 ක් ගෙවා තිබුණි. | කරගත් වියදම් බැවින් ගෙවීම් නිවැරදි බව. | |
| **(ඇ)** | විදේශ ආධාර හා ප්‍රදාන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබුණු පාසැල් නිල ඇඳුම් රෙදි නිෂ්කාශන කටයුතු හා බෙදාහැරීම සඳහා 2022 ඔක්තෝබර් 18 දිනැති අංක අමප/22/1540/607/005-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත අනුමැතිය ලබා දී තිබුණි. එසේ නිෂ්කාශණය හා බෙදාහැරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | නිෂ්කාශණයට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව අතර එළඹි අවබෝධතා ගිවිසුම අනුව නිල ඇඳුම් නිෂ්කාශණය සඳහා රු.8,600,000 ක මුදලක් අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. එසේ වුවද, තත්‍ය වියදම රු.12,276,160 ක් වූයෙන් රු.3,676,160 ක් වැඩිපුර ගෙවා තිබුනද වැඩිපුර වැයවීම් වලට අනුමැතිය ලබා ගැනීම හා එම වැඩිපුර ගෙවූ මුදල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර වැයවීම්වලට අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ලිඛිතව ඇනුම් දී ඇති බව හා වැඩිපුර වැය වී ඇති මුදල මෙතෙක් ගෙවා නොමැති බව. | වැඩිපුර ගෙවූ මුදල අයකර ගත යුතුය. |
| (ii) | දෙවනවර ලද නිල ඇඳුම් තොගයේ නිෂ්කාශණ කටයුතු නිම කර ගබඩාවට බාර දීමට 2023 මාර්තු 19 දින නියමිතව තිබුණද නැව් සංස්ථාව විසින් නිෂ්කාශණ කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.1,890,700 ක අතිරේක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | නැව් සංස්ථාවට තවදුරටත් ගෙවිය යුතු රු. 6,879,066.55 ක මුදල ලැබු පසු අතිරේකව වැය වූ රු.1,890,700ක මුදල අයකර ගැනීමට කටයුතු කළ හැකි බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | පාසල් නිල ඇඳුම් ගබඩා කිරීම සහ බෙදා හැරීමට එකඟ වූ ඇස්තමේන්තුව රු.මිලියන 40 ක් වූ අතර සත්‍ය වශයෙන් දරන ලද වියදම රු.41,930,750 ක් වූයෙන් රු.1,930,750 ක අතිරේක වියදමක් දරා තිබුණි. අතිරේක වියදම සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අතිරේක වියදම ඉල්ලුම් කර ඇතත් එම මුදල දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි. | අමතර වැය වූ රු. 1,930,749.96ක මුදල සඳහා අනුමැතිය ඉල්ලා ලිපි යවා ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.4 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වන්දි ගෙවීම් වලට අදාල පොදු තැන්පත් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පතු ශේෂ105 ක වටිනාකම රු.2,056,432 ක් විය. මෙම ශේෂ වසර 08කට වඩා පැරණි වූ අතර මුදල් රෙගුලාසි 571 අනුව වසර 2 ට වඩා පැරණි ශේෂ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එසේ කටයුතු නොකිරීමට හේතුව ලෙස උසාවි වල පවතින නඩු අවසන් වී නොතිබීම ලෙස තැන්පත් ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද එම සියලුම ශේෂ සම්බන්ධයෙන් අවසන් නොවූ නඩු බවට තහවුරුවක් නොවුණි. | ගිණුම් අංශයේ පවතින ලදුපත් හා සමිති වල තොරතුරු මගින් නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටින බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. සැලැසුම් කිරීම

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන අංශයෙහි ව්‍යාපෘති 06 ක් සංශෝධිත ක්‍රියාකාරි සැලැස්මෙන් ඉවත් කර තිබුණු අතර, පුහුණු අංශය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ පුහුණු වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි. | වියදම් කළමනාකරණ චක්‍රලේඛය මගින් අත්‍යාවශ්‍ය පුහුණු සඳහා පමණක් වැය දැරීමට උපදෙස් ලබා දී තිබූ බැවින්, සමිති/ සංගම් වෙත පුහුණු අවස්ථා ලබාදීම ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කල බව. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | 2023 ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂාවේදී ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති වල ද ප්‍රගතිය දක්වා තිබුණු අතර, ප්‍රගතිය ඉදිරිපත් කිරිමේදී ක්‍රියාකාරකම් සංඛ්‍යාව හා ඉටුකල ක්‍රියාකාරකම් සංඛ්‍යාව වශයෙන් සංඛ්‍යාත්මකව දක්වා තිබුණු බැවින් ඉටුකල ක්‍රියාකාරකම් මොනවා ද යන්න පැහැදිලිව තහවුරු කරගත නොහැකි විය. | අධ්‍යාපන අමාත්‍යාංශය මෙම දෙපාර්තමේන්තුව සමඟ එක්ව කළ ව්‍යාපෘතියක් හේතුවෙන් එහි ප්‍රගතිය ඉදිරිපත් කර ඇති බව හා 2024 වසරේ විස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ප්‍රගතිය විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් දෙපාර්තමේන්තුවේ සියලුම රථවාහන රු.52,555,000 ක වටිනාකමකට තක්සේරු කර තිබූ අතර දෙපාර්තමේන්තුවේ පොත් අනුව රථවාහන වල වටිනාකම රු.37,025,000 ක් වූයෙන් රු.15,530,000 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර තක්සේරු වටිනාකම දෙපාර්තමේන්තු පොත්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල වටිනාකම ඉහල යාම හේතුවෙන් පොත්වල සඳහන් අගයට වඩා වාහන වල තක්සේරු වටිනාකම ඉහල යාමක් සිදුව ඇති බව. | තක්සේරු වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල වාහන අනතුරු 04 ක් සිදු වී තිබුණ ද ඒ පිළිබඳව පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කර නොතිබුණි. | එකඟ වන බව. | වාහන අනතුරු වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 අගෝස්තු 05 දින පැවැත් වූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග සහ අවධානය යොමු කල යුතු කරුණු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| | (i) | 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද මූල්‍ය සේවා සමිති සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා යාවත්කාලීන කිරීමට දත්ත බැංකුවක් ආරම්භ කිරීමේ කාර්යය සඳහා රු.5,920,186 ක මුදලක් වැය කර තිබුණ ද අදාල දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානය යොමු වී තිබුණද, 2023 දෙසැම්බර් වන විට වසර 10 ක් ගත වී තිබුණද දත්ත බැංකුව ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | යෝජිත පරිගණක ජාලගත කිරීමේ වැඩසටහන, ශ්‍රී ලංකාවේ සියලුම මූල්‍ය සේවා සමුපකාර සමිති සඳහා ද සුදුසු වන පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය වෙත දැනුම් දී ඇති බව හා මෙහි පළමු අදියරේ නියමු ව්‍යාපෘතියක් දඹදෙණිය විවිධ සේවා සමුපකාර සමිතියේ සියලුම ග්‍රාමීය බැංකු ශාඛා සඳහා ක්‍රියාත්මක කරමින් පවතින බව. | දත්ත බැංකුව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | පාසල් පෙළ පොතෙහි ඇතුළත් සමුපකාර විෂය පථය පුළුල් කිරීම සඳහා රු.304,916 ක වියදමක් දරා ඇති අතර ඒ ඒ ශ්‍රේණිය සඳහා ඇතුළත් විය යුතු විෂය කොටස් හඳුනාගෙන වාර්තාවක් 2021 දෙසැම්බර් 17 දින පිළියෙල කර තිබුණි. වාර්තාව පිළියෙල කර මේ වන විට වසර දෙකක් ඉක්ම වුවද විගණිත දින වන විටත් එම විෂය කරුණු පාසල් විෂය | 2023 වර්ෂයේ නව විෂය නිර්දේශ සකස් කිරීමේදී පෙළපොත්වලට ඇතුළත් කරන බවට තීරණය වී ඇති බව. | වියදම් මනාව කළමනාකරණය කළ යුතුය. |

නිර්දේශයට ඇතුළත් කර නොතිබුණෙන් වැය කළ රු.304,916 ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙක් පත්කිරීම සඳහා රාජ්‍ය පරිපාලනයෙන් ඉල්ලීම්කර ඇතත්, මෙවනතෙක් නිලධාරියෙක් නම්කර නොමැති අතර, කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කිරීමට නොහැකි වී ඇති බව. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |